# අධිචෝදනා පත්‍රය.

බස්නාහිර පළාතේ කොළඹ පැවැත්වෙන මහාධිකරණය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන්
සභා අංකය: ඕ/55/96

මහාධිකරණයේ අපරාධ
නඩුඅංකය:- බී 1486-2004

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
## එරෙහිව.

චූදිත:- මාකේවිටගේ ලක්ෂ්මන් පතිරාජ සමරසිංහ.

ලිපිනය:- දැදිගම, නෙළුන්දෙනිය.

26 APR 2010

මහාධිකරණ විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරියේදී ය.

සටහන් ගත කිරීම ගයා කුමාරි විසිනි.

නඩුඅංකය:- බි 1486-2004

දිනය:-2010-03-31

26 APR 2010

## තින්දුව.

මෙම නඩුවේ විත්තිකරු වන මාකේවිටගේ ලක්ෂ්මන් පතිරාජ සමරසිංහ යන අයට විරුද්ධව ඉදිරිපත් කර ඇති අධිචෝදනාවන් පහත දැක්වේ.

01. වර්ෂ 1995 ක්වූ ජනවාරි මස 1 වෙනි දින සිට වර්ෂ 1995 ක්වූ ජනවාරි මස 13 වන දින කාලපරිච්ඡේදය තුළ මෙම අධිකරණ බලසීමව තුළ වරකාපොළ දී රජයේ සේවකයකු වූ එනම් රජයේ ආයතනයක් වූ වරකාපොල ප්‍රාදේශිය සභාවේ සභාපති ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා රජයේ ආයතනය සමග ගනුදෙනුවක යෙදී සිටි නළුම්, උඩගම තඹදිය සහ එබ්බිගල පාරවල් තුන සෑදිම සදහා වරකාපොල ප්‍රදේශිය සභාව සමග වූ ගිවිසුම මත කටයුතු කරමින් සිටි කළුකෝකිල අච්චිල්ලාගේ වික්‍රමසිරි විරසිංහ යන අයගෙන් රුපියල් 25,000/- ක් වූ මුදලක තුටු පඩුරක් අයැදිමෙන් අල්ලස් පනතේ 21(ඇ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

02. ඉහත 1 වන චෝදනාවේ සදහන් වේලාවේදී ස්ථානයේදී සහ එකී ක්‍රියාකලාපයේදීම මෙම අධිකරණ බලසීමාව තුළ වරකාපොල දී රජයේ සේවකයකු වූ එනම් වරකාපොල ප්‍රාදේශිය සභාවේ සභාපති ලෙස සේවයේ යෙදී

සිටි යුෂ්මතා රුපයිල් 25,000/- ක් වූ මුදලක තුටු පඩුරක් කළුකෝකිල අච්චිල්ලාගේ වික්‍රමසිරි විරසිංහ යන අයගෙන් අයැදීමෙන් 1974අංක 38 දරණ අල්ලස් (සංශෝධන) නීතියේ 8 වන වගන්තිය මගින් හ 1980 අංක 9 දරණ අල්ලස් (සංශෝධන) පනතේ 11 වන වගන්තිය මගින් සංශෝධිත අල්ලස් පනතේ 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

26 APR 2010

03. වර්ෂ 1995 ක්වූ ජනවාරි මස 12 වෙනි දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණ බලසීමාව තුළ පරකාපොල දී රජයේ සේවකයකු වු එනම් රජයේ ආයතනයක් වූ වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා, එකී රජයේ ආයතනය සමග ගනුදෙනුවක යෙදී සිටි එනම් උඩගම තඹදිය සහ ඒබිටිගල පාරවල් තුන සෑදීම සදහජ වරකාපොල ප්‍රාදේශීය සභාව සමග වූ ගිවිසුම මත කටයුතු කරමින් සිටි කළුකෝකිල අච්චිල්ලාගේ වික්‍රමසිරි විරසිංහ යන අයගෙන් රුපියල් 20,000 ක්වූ මුදලක තුටු පඩුරක් භාර ගැනීමෙන් අල්ලස් පනතේ 21(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

04. වර්ෂ 1995 ක්වූ ජනවාරි මස 13 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණ බලසීමාව තුළ වරකාපොල දී රජයේ සේවකයකු වු එනම් රජයේ ආයතනය්ක වූ වරකාපොල ප්‍රාදේශීයසභාවේ සභාපති ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා එකී රජයේ ආයතනය සමග ගනුදෙනුවක යෙදී සිටි උඩගම තඹදිය සහ ඒබිටිගල පාරවල් තුන සෑදීම සදහා වරකාපොල ප්‍රාදේශීය සභාව සමගවූ ගිවිසුම මත කටයුතු කරමින් සිටි කළුකෝකිල අච්චිල්ලාගේ වික්‍රමසිරි විරසිංහ යන අයගෙන් රුපියල 5000 ක මුදලක තුටු පඩුරක් භාර ගැනීමෙන්

අල්ලස් පනතේ 21(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

05. ඉහත කී 3 වන චෝදනාවේ සදහන් වේලාවේදී ස්ථානයේදී සහ එකී ක්‍රියාකලාපයේදීම මෙම අධිකරණ බලසීමාව තුල වරකාපොල දී රජයේ සේවකයකු වු එනම් වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා රුපියල් 20000/- ක්වූ මුදලක තුටු පඩුරක් කළුකෝකිල අව්විල්ලාගේ වික්‍රමසිරි වීරසිංහ යන අයෙගන් භාර ගැනීමෙන් 1974 අංක 38 දරණ අල්ලස් (සංශෝධන) නීතියේ 8 වෙනි වගන්තිය සමග හා 1980 අංක 9 සරණ අල්ලස් (සංංශෝධන) පනතේ 11 වන වගන්තිය මගින් සංශෝධිත අල්ලස් පනතේ 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

06. ඉහත 4 වන චෝදනාවේ සදහන් වේලාවේදී ස්ථානයේදී සහ එකී ක්‍රියාකලාපයේදීම මෙම අධිකරණ බලසීමාව තුළ වරකාපොල දී රජයේ සේවකයකු වූ එනම් වරකාපොල ප්‍රදේශීය සභාවේ සභාපති ලෙස සේවයේ යෙදී සිටි යුෂ්මතා රුපියල් 5000 ක් වූ මුදලක තුටුපඩුරක් කළුකෝකිල අව්විල්ලාගේ වික්‍රමසිරි වීරසිංහ යන අයගෙන් භාරගැනීමෙන් 1974 අංක 38 දරණ අල්ලස් (සංශෝධිත) නීතියේ 8 වන වගන්තිය මගින් හා 1980 අංක 9 දරණ අල්ලස් (සංශෝධන) පනතේ 11 වන වගන්තිය මගින් සංශෝධිත අල්ලස් පනතේ 19(ඇ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇති බවයි.

26 APR 2010

මෙම අධිචෝදනාවන් සනාථ කිරීම සඳහා පැමිණිල්ල විසින් පහත සඳහන් සාක්ෂිකරුවන් සාක්ෂියට කැඳවා ඇත.

- කළුකෝකිල අච්චිල්ලාගේ වික්‍රමසිරි වීරසිංහ.
- හල්ලවආරච්චිලාගේ චන්ද්‍රලතා කුසුමාවති ජයසේකර.
- කන්දපේලි ආරච්චිලාගේ කුසුමානන්ද
- අරඹලාගේ චන්ද්‍රසිරිල් ගුණරත්න.
- රන්කොත් ෂෙල්ටන් විජේසිංහ.
- සී.ඩී කළුපහන.

26 APR 2010

මෙම සාක්ෂි කැඳවීමෙන් පසු පැමිණිල්ල අවසන් කර ඇති අතර, ඊට පසු විත්තිකරු විත්තියේ සාක්ෂි කැඳවා ඇත. විත්තිකරු සාක්ෂි කූඩුවට නැග සාක්ෂි දී ඇති අතර, විත්තිය වෙනුවෙන් තවත් සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් සාක්ෂියට කැඳවා ඇත.

මෙවැනි අපරාධ නඩුවකදී පැමිණිල්ල විත්තිකරුට එරෙහිව තම නඩුව සාධාරණ සැකයෙන් තොරව සනාථ කලයුතුව ඇත. එසේ පැමිණිල්ල විසින්

විත්තිකරුට එරෙහිව ඉදිරිපත් කර ඇති අධිචෝදනාවන්හි ඔප්පු කලයුතු ප්‍රධාන අංග සාධාණ සැකයෙන් තොරව සනාථ කිරීම පැමිණිල්ලේ වගකීමක් වේ. මේ අනුව පහත සදහන් අධිචෝදනාවන්හි අංග පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව සනාථ කලයුතු වේ. ඒවා නම් පහත දැක්වේ.

- විත්තිකරගේ අනන්‍යතාවය.
- විත්තිකරු රුපියල් 25,000 ක මුදලක් තුටු පඩුරක් වශයෙන් ඉල්ලා සිටිම.
- විත්තිකරු රුපියල් 20,000 ක මුදලක් පැමිණිලිකරුගෙන් තුටු පඩුරක් වශයෙන් භාර ගැනීම.
- විත්තිකරු රුපියල් 5000 ක මුදලක් පැමිණිලිකරුගෙන් තුටු පඩුරක් වශයෙන් භාර ගැනීම.
- විත්තිකරු රජයේ සේවකයකු බව.

6 APR 2010

ඉහත සදහන් අධිචෝදනාවන්හි ප්‍රධාන අංග පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇද්දැයි පරීක්ෂා කර බැලීමට ප්‍රථමයෙන් අධිකරණය පැමිණිල්ල විසින් දෙන ලද සාක්ෂි වල විශ්වාසනියත්වය ඇගයීමට ලක් කරමි. මේ අනුව අධිකරණය එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පින්ඩනය කර ඇගයීමට ලක් කරමි. පැමිණිලිකරු වන වික්‍රමසිරි වීරසිංහ අධිකරණයේ සාක්ෂි දෙමින් ප්‍රකාශ තර ඇත්තේ, තමන් වරකාපොල ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී තිබුන බවයි. එය සනාථ

කිරීමට පැ. 01 ලේඛණය ලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව තමන් 1994 දී උඩගම තඹදිය ඒබ්බිගල පාරවල් තුන සකස් කිරීමට කොන්ත්‍රාත්තුවක් වරකාපොල ප්‍රදේශීය සභාවෙන් ලබා ගැනීමට ටෙන්ඩරයක් ඉදිරිපත් කල බවත් එම ටෙන්ඩරය අනුව තමන් විසින් ඉදිරිපත් කල වියදම් ඇස්තමේන්තුව අධික බැවින් එම ඇස්තමේන්තු මුදල රුපියල් 44307.15 කට නිම කර දෙන්න කැමැති ද කියලා වරකාපොල ප්‍රදේශීය සභාවේ සභාපතිතුමා විසින් පසුව විමසා සිටි බවත්ය. එය සනාථ කිරීමට පැ. 2 ලේඛණය ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙයින් පසු තමන් එම කොන්ත්‍රාත්තුව භාර ගැනීමේ ගිවිසුමකට එළඹුන බවත් සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පොරොන්දු පත්‍රය 1994-10-25 වන දින වරකොපොල ප්‍රාදේශය සභාවේ ලක්ෂමන් පතිරාජ මහතා ලේකම් චන්ද්‍රා ජයසේකර මහත්මිය සමග කොන්ත්‍රාත් කරුවකු සමග තමන් අත්සන් කල බවත් එම පොරොන්දු පත්‍රය පැ. 3 වශයෙන් ලකුණු කර ඉදිරිත් කර ඇත. මෙම ටෙන්ඩරය අනුව තම කොන්ත්‍රාත්තුවා ලබා ගැනිමෙන් පසුව ගල්රෝලක් සොයා ගැනිමට නොහැකි වීම මත අදාල කාල සීමාවේදී එම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ප්‍රමාද වීම සම්බන්ධයෙන් තමන් සභාපතිතුමාට දන්වා සිටි බවත් ප්‍රකාශ කර ඇත. සභාපතිතුමා මෙම අවස්ථාවේදී දෙසැම්බර් මාසය අවසාන වන විට මුදල් ඉවර වන බැවින් කාර්මික නිලධාරී මහතාට බිලක් හරි ගස්සලා බිල පළාත්සභාවට ඉදිරිපත් කරන්න කියලා පැවසූ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මෙයින් පසු තමන් කාර්මික නිලධාරී මහතා සමග මිනුම් අරගෙන ගල්වැලි සහ

26 APR 2010

අනෙකුත් ද්‍රව්‍ය වලට බිලක් හරිගස්වා සබරගමුව පළාත් සභාවට ඉදිරිපත් කල බවත් එම වාර්තාව චන්ද්‍රසිරිල් ගුණරත්න කාර්මික නිලධාරියා සාදා දුන් බවත් සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. අදාළ මිනුම් වාර්තාව පැ. 4 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉන්පසුව මෙම කොන්ත්‍රාත්තුව සදහා මුදල් ගෙවීමට සභාපතිතුමාගෙන් එනම් විත්තිකරුගෙන් අනුමැතිය ලැබුන බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එම මුදල් ලබා ගැනිමේ වව්චර් පත්‍රය පැ.5 වශයෙන් ලකුණු කර ඇත. මෙයින් පසු 1994-12-31 වන දින පමණ තමන්ට උඩගම, තඹදිය සහ ඒබඩිගල කොන්ත්‍රාත්තුවේ මුදල් ලැබුන බවත් මුදල් චෙක් පත්‍රය ලැබුන බවත් ඉන් පසුව එය තමන්ගේ ගිණුමට තැන්පත් කල බවත් ප්‍රකාශ කර ඇත. මෙම මුදල් තැන්පත් කර දින කිහිපයකට පසු සභාපතිතුමා වන විත්තිකරු තමන්ගෙන් මෙම චෙක්පත්‍රය ගත්තාද කියලා විමසා සිටි බවත් සාක්ෂි දී ඇත. මෙයින් පසු සභාපතිතුමා වැඩේ නොකර මුදල් ගෙවලා තිබෙන බව ප්‍රකාශ කර ඉන් පසු තමන්ට රුපියල් 25,000 ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත් වැඩිදුරටත් මූලික සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. එමම මුදල් ඉල්ලා සිටියේ වරකාපොල ප්‍රාදේශිය සභාවේ සභාපති වන එම්.ඒල් පී සමරසිංහ බවත් ය. තමන් එවිට චෙක් පත්‍රය මාරු වෙන්න ඕනේ කිව්ව බවත් දින කිහිපයක් ඕනේ කිව්ව බවත් තමන්ට වැඩේ කරන්න මුදල් අවශ්‍යයි කියලා කිව්ව බවත්ය. මේ අනුව මුදල් ලැබුනු විගස දෙන්නම් කියලා කිව්ව බවත් ප්‍රකාශ කර ඇත. 1995-01 වන මාසයේ මුල් සති වල මුදල් ඉල්ලා සිටි බවත් වැඩිදුරටත් සදහන් කර ඇත. මෙම මුදල්

26 APR 2010

ඉල්ලා සිටියේ වරකාපොල ප්‍රදේශීය සභාවේ සභාපති බවත් අද දින ඔහු අධිකරණයේ සිටින විත්තිකරු බවත් පැමිනිලිකරු අධිකරණයේදී හදුනාගෙන ඇත. මෙසේ මුදල් තමන්ගෙන් දින කිහිපයක්ම ඉල්ලා සිටිමෙන් පසුව විත්තිකරු තමන්ගේ කෑගල්ල ශාඛාවේ ගිණුමක තැන්පත් කරන්න කියලා ගිණුම් අංකය හා පුද්ගලයාගේ නම කොල කැබැල්ලක ලියා දුන් බවත් ප්‍රකාශ කර ඇත. එම විත්තිකරු විසින් ලබා දුන් කොල කැබැල්ලේ සභාපතිතුමාගේ නම එම්.ඒ.පී සමරසිංහ, එම බැංකු ශාඛාව, කෑගල්ල මහජනබැංකුව, කඩවිදිය ශාඛාව,දැඩිගම වශයෙන් තිබුන බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එහි ගිණුම් අංකය 525 වශයෙන් සටහන් වි තිබුන බවත් ප්‍රකාශ කර ඇත. මෙම ලියවිල්ල සභාපති විසින් දෙන ලද බවත් සභාපතිතුමාගේ නිල කාමරයට එන්න කියලා නිල මේසය උඩ තබාගෙන ලිව්ව බවත් එය පැ. 7 වශයෙන් පැමිනිල්ල මූලික සාක්ෂියේදී ලකුණු කර ඇත. පසුව තමන් ගේ අතේ රුපියල් 25,000 ක් නොතිබුන බැවින් ගිණුමේ රුපියල් 20,000 ක් තැන්පත් කරන ලද බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. 1995-01-12 වන දින මෙම මුදල් තැන්පත් කරනලද බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. ඉන් පසු තමන් ඒ බව දුරකථනයෙන් විත්තිකරුට තමන්ගේ අතේ මුදල් නොමැති බැවින් 20,000ක් ගිණුමේ තැන්පත් කරන ලද බව දන්වා සිටිමෙන් ප්‍රකාශ කර ඇත. එසේ රු 20,000 ක් තැන්පත් කල බව විත්තිකරුට දැනුම් දීමෙන් පසු රුපියල් 5000 ක් හෙටවත් තැන්පත් කරන්න කියලා විත්තිකරු දැනුම් දීමෙන් පසු නැවතත් රුපියල් 5000ක් තැන්පත් කරන ලද බවත් එයද

26 APR 2010

විත්තිකරුට දන්වා සිටි බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ තැන්පත් කිරීමෙන් පසුව බැංකුවෙන් තමන්ට ලැබුන කොල කැබැල්ල තමන් භාරයේ තිබුන බවත් මෙම අවස්ථාවේදී එම කොල කැබැල්ල නොමැති බවත් ඉන් පසුව මුදල් තැන්පත් කිරීමේ පිටපත පෙන්වා සිටීමෙන් පසු රුපියල් 20,000 ක් මුදලක් 1995-01-12 වන දින තැන්පත් කරන ලද විස්තර පත්‍රිකාව බවත් සාක්ෂිකරු පිලිගෙන ඇත. එය පැ. 8 වශයෙන් ලකුණු කර ඇති බවත් එහි ඇති අත්සන පැ. 8(අ) වශයෙන් ලකුණු කර ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. 1995-01-13 වන දින රුපියල් 5000ක් ගිණුම් අංක 525 ට මහජන බැංකුවේ තැන්පත් කර තිබෙන බවත් එම රිසිට් පත්‍රය පැ. 9 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇති බවත් එහි ඇති අත්සන පැ. 9(අ) වශයෙන් ලතුනු කර ඉදිරිපත් කර ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. ඉන් පසු කාර්මික නිලධාරියා තමන්ට කොන්ත්‍රාත්තුව ඉවර කරන්න බල කල බැවින් සභාපතිතුමාගෙන් සල්ලි ඉල්ලා සිටි බවත් එවිට රුපියල් 10,000 ක් දෙන්නම් කියලා කිව්ව බවත් එය රුපියල් 1000 බැගින් ටික ටික දෙන්නම් කිව්ව බවත් ඉතිරි ඒවා නොසලකා හරින්න කියලා කිව්ව බවත් ප්‍රකාශ කර ඇත. ඉන් පසු 1995 අවුරුද්දේ අප්‍රේල් මාසයේ ඉල්ලන කොට රු 2700/- චෙක් පත්‍රයක් දුන් බවත් එම මුදල් චෙක් පත්‍රය ලැබීලා තිබුනේ මනෝද විජේරත්නගෙන් බවත් එම චෙක් පත්‍රය මාරු කර රුපියල් 2700/- ක් ගන්න කිව්ව බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එම චෙක් පත්‍රය තමන්ගේ ලංකා බැංකුවේ ගිණුමේ තැන්පත් කරන ලද බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එම චෙක්

26 APR 20

පත්‍රය පැ. 10 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. එහි ඇති නම සහ අත්සන පැ. 10 (අ) වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. මෙම පැමිණිලිකරුගේ මූලික සාක්ෂිය අනුව පැමිණිලිකරු අධිකරණයට ප්‍රකාශකර ඇත්තේ, මෙම නඩුවේ විත්තිකරු රුපියල් 25,000 ක මුදලක් කොන්ත්‍රාත්තුව අවසන් නොකර ප්‍රාදේශිය සභාවෙන් මුදල් ලබා දීම සම්බන්දයෙන් ඉල්ලා සිටි බවයි. ඒ අනුව තමන් රුපියල් 25,000 ක මුදලක් දින දෙකකදී බැංකුවේ තැන්පත් කල බවයි. එසේ බැංකුවේ තැන්පත් කිරීමට පැ. 7 ලේඛණය පැමිණිලිකරු විසින් ලබා දී ඇත. මෙම සාක්ෂිය සම්බන්දයෙන් නගන ලද හරස් ප්‍රශ්න වලදී පැමිණිලිකරුගේ සාක්ෂියේ නඩුවේ අරටුවට බලපාන පරස්පරතාවයක් හෝ ඌනතාවයක් ලකුණු කිරීමට මෙම නඩුවේදී විත්තිය සමත් වී නැත මේ සම්බන්දයෙන් අධිකරණය Bhoghibhai Hirijivhi Vs state of Gujrat Air 1983 SC 752 නඩුව සම්බන්ධයෙන්ද අවධානය යොමු එම නඩු තීන්දුවේදී ප්‍රකාශ වී ඇත්තේ., පැමිණිල්ලේ සාක්ෂි ඇගයීමේදී පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වල පරස්පරතාවයන් මත පැමිණිල්ලේ අරටුවට හානි සිදු වන්නේ නම් එම පරස්පරතාවයන් සම්බන්ධයෙන් අධිකරණයේ අවධානය යොමු කලයුතු බවයි. එහෙත් මෙම නඩුවේදී පැමිණිලිකරුගේ හෝ අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලින් කිසිදු නඩුවේ අරටුවට බලපාන පරස්පරතාවයක් හෝ ඌනතාවයක් ලකුනු කිරීමට පැමිණිල්ල සමත් වී නැත. තවද මෙම නඩුවේ පැමිණිලිකරුගේ සාක්ෂිය සම්බන්දයෙන් විත්තිය විසින් නගන ලද හරස් ප්‍රශ්ණ වලදී පැමිණිලිකරු හා විත්තිකරු අතර පෙර

26 APR 2010

කොන්ත්‍රාත් ලබා දීමේදී ඇති වූ ආරවුල මත අමනාපයක් තිබෙන බවට වන ස්ථාවරය විත්තිය විසින් ගනු ලැබුවද, එය සනාථ කිරීමට විත්තිය සමත් වී නැත. පුටු සෑදීම සඳහා ඇති වූ කොන්ත්‍රාත්තුව මත හා වෙනත් කොන්ත්‍රාත් මත පැමිණිලිකරු හා විත්තිකරු අතර යම් හබයක් ඇති වී ඇති වුවද, එම කොන්ත්‍රාත් වලින් පසුව මෙම පැමිණිලිකරු මෙම නඩුවට අදාල කොන්ත්‍රාත්තුව ලබා දී ඇති බව අධිකරණයට සනාථ වේ. මෙම සිද්දිය වීමෙන් පසුවද කොන්ත්‍රාත්තුවට පැමිණිලිකරුට ලබා දී ඇති බවත් අධිකරණයට සනාථ වේ. මෙබැවින් පැමිණිලිකරු හා විත්තිකරු අතර, කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ඇති වූ යම් අමනාපයක් මත අසත්‍ය සාක්ෂි පැමිණිලිකරු විත්තිකරුට එරෙහිව දෙන ලද මෙම විත්තියේ ස්ථාවරය අධිකරණයට මෙම නඩුවේදී පිලිගත නොහැකිය. පැමිණිලිකරුට මෙම නඩුවේදී තමන් විසින් පැ. 8 සහ පැ. 9 ලේඛණ අනුව විත්තිකරුගේ කෑගල්ල මහජන බැංකුවේ මුදල් තැන්පත් කල බව අධිකරණයට සනාථ කර ඇත. එසේම පැ. 7 ලේඛණය තමන්ට විත්තිකරු විසින් ලබා දුන් බවත් පැමිණිලිකරු තම සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. මෙම පැ. 7 ලේඛණ සම්බන්දයෙන් අධිකරණය කරුණු පරීක්ෂා කර බැලීමේදී මෙම නඩුවේදී සාක්ෂි දෙන ලද ආණ්ඩුවේ සැකකටයුතු ලේඛණ පරීක්ෂකගේ සාක්ෂිය සම්බන්දයෙන් අධිකරණයේ අවධානය යොමු කරන ලදී. සැකකටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක, රජයේ රස පරීක්ෂකවරයා අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, පැ. 7 ලේඛණයේ එම්.එල්.පී සමරසිංහ දැදිගම වශයෙන් ලියා ඇති කොටසද මහජන බැංකුව කඩවිදිය කෑගල්ල යන කොටසේද

ඇති අත්අකුරු විත්තිකරුට සමාන බවයි. පැ.7 ලේඛණයෙහි අත්අකුරු චූදිතගේ අත්අකුරු බව එම විත්තිකරු පිලිගෙන ඇත. මේ අනුව පැ. 7 වශයෙන් ඉදිරිපත් කර ඇති ලේඛණයේ අත්අකුරු විත්තිකරුගේ බව පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇත. පැ.7 ලේඛණය මුදල් බැංකුවේ තැන්පත් කිරීමට නම සහිතව පැමිණිලිකරුට ලබා දී ඇත්තේ විත්තිකරු බව පමිණිලිකරු තම සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. තවද මෙම නඩුවේදී සාක්ෂි දීමට කැඳවන ලද ප්‍රාදේශීය කළමනාකරු මහජන බැංකුව, කැගල්ල විසින් අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, පැ.8 සහ පැ. 9 ලේඛණ අනුව විත්තිකරුගේ ගිණුමට රුපියල් 20,000 කමුදලක් හා රුපියල් 50,000 ක මුදලක් තැන්පත් වි ඇති බවයි. මේ අනුව පැ. 8 ලේඛණය අනුව මෙම මුදල් රුපියල් 20,000 1995-01-12 වන දින තැන්පත් කරලා තිබෙන බවත් රුපියල් 5000 ක මුදල 1995-01-13 වන දින තැන්පත් කර තිබුන බවත් මේවා ගිණුම් අංක 525 ට සමරසිංහ යන අයගේ නමින් තැන්පත් වි තිබුන බවත් මහජනබැංකුවේ කළමනාකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය බිඳ හෙලීමට විත්තිය සමත් වි නැත. තවද මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ. මෙම මුදල් තැන්පත් කරන අවස්ථාව වන විට විත්තිකරුගේ ගිණුම අයිරා වී තිබුන බවත් එම අයිරාවට මෙම මුදල් දැමීමෙන් පසු අයිරාව අඩුවී තිබුන බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මෙයින් අධිකරණයට සනාථ වන්නේ පමිණිලිකරුගේ සාක්ෂිය සනාථ කරමින් බැංකු කළමනාකාරු හා ඇඟිලි සලකුණු පරික්ෂකවරයා සාක්ෂි දී ඇති බවයි.

26 APR 2010

එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිය බිඳ හෙලීමට විත්තිය සමත් වී නැත. මෙම නඩුවිදී පැමිණිලිකරු ප්‍රකාශ කරන අන්දමට පැමිණිලිකරු විසින් විත්තිකරුගේ ගිණුමට අදාල දිනයන්හි රුපියල් 20,000 ක් හා රුපියල් 5000 ක් බැංකුවේ තැන්පත් කර ඇති බව පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇති බවයි. මෙම පැමිණිලකරු විසින් මුදල් තැන්පත් කිරීම පිළිබඳව ඔහු අධිකරණයට දෙන ලද සාක්ෂිය බිඳ හෙලීමට විත්තිය සමත් වී නැත. එසේම මෙම නඩුවට අදාල කොන්ත්‍රාත්තුව පැමිණිලිකරුට ප්‍රාදේශීය සභාව විසින් ලබා දීම සනාථ කිරීමට චන්ද්‍රලතා කුසුමාවතී සාක්ෂි දී ඇති අතර, ඊට අමතරව කාර්මික නිලධාරී චන්ද්‍රසිරිල් ගුණරත්න අධිකරණයේ සාක්ෂි දී ඇත. චන්ද්‍රසිරිල් ගුණරත්න අධිකරණයේදී සාක්ෂි දෙමින් තමන් මෙම විත්තකරුගේ කොන්ත්‍රාත්තුව සම්බන්දයෙන් ගෙවීම් වාර්ථාවක් පිලියෙල කල බවත්ය. එම වාර්ථාව පැ. 6 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ඇත. මේ අනුව පැ. 6 තමන් විසින පරීක්ෂා කිරීමෙන් පසුව සාදන ලද ගෙවීම් වව්චරයක් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මේ අනුව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර අත්තේ, පැ. 6 ගෙවීම් වාර්ථාවේ තමන්ගේ අත්සන තිබෙන බවත් එම අත්සන පැ. 6 (ඇ) ලෙස ලකුණු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. මෙම පැ. 6 ලේඛණය තමන් විසින් සකස් කරන ලද බවත්ය. ගල් ඇතිරීම සහ ගල් දැමීම, පලමුවර තාර දැමීම සම්පූර්ණ නොකර පැ. 6 ලේඛණය ඉදිරිපත් කල බවත් මෙසේ කරන ලද්දේ සභාපතිතුමාගේ උපදෙස් මත බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මේ අනුව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ,

26 APR 2010

සභාපතිතගේ උපදෙස් මත ගෙවීම් වාර්තාව පිළියෙල කර පළාත්සභාවට යවන ලද බවයි. ඉන් පසු ගෙවීම් වාර්තාව පිළියෙල කරන ලද බවයි. තවද තමන්ට විරුද්ධව පැවති විනය පරීක්ෂනයේදී ගෙවීම් වව්චරය පිළියෙල කිරීම වැරදි බවත් තීරණය වී ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. මෙම කාර්මික නිලධාරියා ප්‍රාදේශීය සභාවේ සභාපති ලක්ෂ්මන් පතිරාජ සමරසිංහ වන විත්තිකරු අධිකරණයේ සිටින විත්තිකරු බවත් අධිකරණයේදී හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිය අනුව සනාථ වන්නේ විත්තිකරුගේ උපදෙස් මත ගෙවීම් වාර්තාව සකස් කර මුදල් ගෙවීම සඳහා වව්චර පත් ඉදිරිපත් කර ඇති බවයි. විත්තිකරුගේ උපදෙස් මත මෙම ගෙවීම් වාර්තාව සකස් කර මුදල් ගෙවීමට ලේඛණ ඉදිරිපත් කරන ලද බවට දෙන ලද මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය බිඳ හෙළීමට විත්තිය සමත්වී නැත. මෙබැවින් එම සාක්ෂිකරුගේ සාක්ෂිය අධිකරණය විශ්වාසනීයත්වයෙන් යුත් සාක්ෂියක් බවට සලකමි.

26 APR 2010

තවද මෙම නඩුවේදී සාක්ෂ දෙන ලද කුසුමානන්ද නැමැති පරිපාලන නිලධාරියා වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, පැ. 5 වව්චරය වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අනුමත කර ඇති බවයි. පැ. 5 වව්චරය වරකාපොල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අනුමත කරලා තියෙන බවත් ප්‍රකාශ කර ඇත. මෙම පැ. 5 ලේඛණය ගෙවුම් වව්චරයක් බවත් ඔහු ප්‍රකාශ කර ඇත. මේ අනුව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, පැ. 5 ලේඛණයේ රුපියල් 31905.31 ක මුදලක් ගෙවීමට

අනුමත කර ඇති බවත් එය චෙක් පත්‍රයකින් ගෙවා ඇති බවත්ය. එම චෙක් පත්‍රය එඩබ්ලිව් විරසිංහගේ නමට නිකුත් කර ඇති බවත්ය. මේ අනුව ගණකාධිකාරීවරයා සාක්ෂි දෙමින් මෙම මුදල් වින්තිකරුගේ අනුමැතිය මත ගෙවා ඇති බවත් අධිකරණයට සනාථ කර ඇත. මේ අනුව පැමිණිලිකරුගේ සාක්ෂිය හා පැමිණිලිකරු විසින් කැඳවන ලද අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මගින් පැමිණිල්ල අධිකරණයට සනාථ කර ඇත්තේ, විත්තිකරුගේ ඉල්ලීම මත රුපියල් 20,000 ක මුදලක් හා රුපියල් 5000 ක මුදලක් කෑගල්ල මහජන බැංකුවෙන් පැමිණිලිකරු විසින් තැන්පත් කර ඇති බවයි. මෙම නඩුවේදී පැමිණිල්ල විසින් කැඳවන ලද සාක්ෂිකරුවන් විසින් පැමිණිලිකරු වරකාපොල ප්‍රදේශිය සභාවේ කොන්ත්‍රාත්කරුවෙකු බවත් සනාථ කර ඇත. විත්තිය විසින් පැමිණිලිකරුගෙන් නගන ලද හරස් ප්‍රශ්ණ වලදී පැමිණල්ල හා විත්තිකරු අතර අමනාපයක් මත මෙම අසත්‍ය සාක්ෂි දෙන ලද බව ප්‍රශ්ණ කරනු ලැබුවද එය සනාථ කිරීමට විත්තිය සමත් වි නැත. විත්තියෙන් මෙම නඩුවේදී පැමිණිලිකරුගෙන් නගන ලද හරස් ප්‍රශ්ණ වලදී ගන්නා ලද ස්ථාවරය වූයේ විත්තිකරු විසින් තම රියදුරුට බැංකුවේ තැන්පත් කිරීම සඳහා රුපියල් 25,000 ක් ලබා දීමෙන් පසුව පැමිණිලිකරු එම රියදුරු සමග කැබ් රථයෙන් ගමන් කරන අවස්ථාවේදී කැබ් රථයේ රියදුරු විසින් එම මුදල පැමිණිලිකරුට බැංකුවේ තැන්පත් කිරීමට ලබා දී ඇති බවටය. මේ අනුව විත්තිකරුගේ රියදුරු විසින් පැමිණිලිකරුට මෙම විත්තිකරුගේ මුදල් බැංකුවේ තැන්පත් කිරීම සඳහා කෑගල්ලට යන අවස්ථාවේදී

26 APR 2010

පැමිණිලිකරුට ලබා දුන් බවට වන ස්ථාවරය මත විත්තිය විසින් පැමිණිලිකරුගෙන් හරස් ප්‍රශ්ණ අසා ඇත. එහෙත් පැමිණිලිකරු එම යෝජනාවද පිලිගෙන නැත. පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, 1995-01-12 වන දින තමන් විත්තිකරුගේ කැබ් රථයෙන් වරකාපොල ප්‍රාදේශිය සභාවේ සිට කෑගල්ලට නොගිය බවයි. විත්තිකරු විසින් මෙම කැබ් රථයේ රියදුරුට පැ. 7 තුංඩුව දී රුපියල් 25,000 ක මුදලක් පැමිණිලිකරුට ලබා දී එම මුදල් තැන්පත් කල බවට යෝජනා කලද එය පැමිණිලිකරු පිලිගෙන නැත. මේ අනුව විත්තිය විසින් මෙම නඩුවේ පැමිණිලිකරුගෙන් නගන ලද හරස් ප්‍රශ්ණ වලින් ගන්නා ලද ස්ථාවරය වි ඇත්තේ, මෙම විත්තිකරු විසින් විත්තිකරුගේ රියදුරුට තැන්පත් කිරීමට දුන් මුදල රියදුරු විසින් පැමිණිලිකරුට බැංකුවේ තැන්පත් කිරීමට දීමෙන් පසු පැමිණිලිකරු එය බැංකුවේ තැන්පත් කර ඇති බවටය.

26 APR 2010

මෙම විත්තය විසින් ගන්නා ලද ස්ථාවරය අනුව පැමිණිලිකරු විසින් මෙම රුපියල් 20,000 හා රුපියල් 5000 ක මුදලක් මෙම අදාල දිනයන්හි බැංකුවට තැන්පත් කිරීම සම්බන්දයෙන් විත්තිය හබ කිරීමක් කර නොමැති බව අධිකරණයට සනාථ වේ. මේ අනුව පැ. 7,8,9 ලේඛණ විත්තිකරුගේ ස්ථාවරය අනුව පිලි ගැනීමක් මෙම නඩුවේදී සිදු වි ඇත. විත්තියෙන් නගන ලද හරස් ප්‍රශ්න වලදී පැමිණිලිකරුට යෝජනාකර ඇත්තේ. පැ. 7 ලේඛණය විත්තිකරුගේ රියදුරු විසින් පමිණිලිකරුට ලබා දී ඇති බවයි. එබැවින් පැමිණිලිකරු

විසින් මෙම නඩුවේදී පැ. 7 වශයෙන් ලකුණු කරන ලද ලේඛණය සම්බන්දයෙන් හබ කිරීමක් විත්තිය කර නැත. කෙසේ වුවද අත්අකුරු පරීක්ෂකද ප්‍රකාශ කර ඇත්තේ, මෙම අත්අකුරු විත්තිකරුගේ අත්අකුරු වලට සමාන බවයි. මෙම චූදිතගේ අත්සන ඔහුගේ බව පිලි ගැනීමක් කර ඇත. පැ. 8,9 ලේඛණ අනුව රුපියල් 20,000 ක් හා රුපියල් 5000 ක් මුදලක් විත්තිකරුගේ ගිණුමේ තැන්පත් වීම සම්බන්දයෙන් විත්තිය හබ කර නැත. විත්තියේ ස්ථාවරය වී ඇත්තේ. එම මුදල් බැංකුවේ තැන්පත් කිරීමට ලබා දී තිබුනේ විත්තිකරුගේ රියදුරුට බවයි. විත්තිකරුද සාක්ෂි කූඩුවට නැග සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් මෙම මුදල් විත්තිකරුගේ රියදුරු වන මාපාට බැංකුවේ තැන්පත් කිරීමටලබා දුන් බවයි. විත්තිකරුටග් රියදුරු මාපාද අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, කැගල්ලට යන අවස්ථවේදී මෙම පැමිණිලිකරු කැබ් රථයෙන් යන ලද බවත්ය මෙම අවස්ථාවේදී බැංකුවට යාමට සිදු වූ අපහසුව මත රුපියල් 25,000 ක මුදලක් පැ 7 තුංඩුව සමග පැමිණිලිකරුට බැංකුවේ තැන්පත් කිරීමට දුන් බවයි. එහෙත් පැමිණිලිකරු පළමු දිනයේ රුපියල් 20,000 ක මුදල තැන්පත් කර අනෙක් රුපියල් 5000 ක මුදල තමන්ට තැන්පත් කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කල බවත් ඒ අනුව තමන් හා පැමිණිලිකරු අතර ආරවුලක් ඇති වූ බවත් පසු දින එම රුපියල් 5000 ක මුදල් බැංකුවේ තැන්පත් කර ඇති බවත්ය.

26 APR 2010

මෙම නඩුවේදී පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සළකා බැලීමෙන් පසුව අධිකරණය නිගමනය කරනුයේ පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ද සාක්ෂි සියල්ලම විශ්වාසනීයත්වයෙන් යුත් බවට සනාථ කර ඇති බවයි. එම සාක්ෂි වල නඩුවේ අරටුවට බලපාන පරස්පරතාවයක් හා ඌනතාවයන් කිසිවක් නැත. මේ අනුව පැමිණිල්ල විසින් දිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛණ මගින් විත්තිකරුට එරෙහිව බලගතු නඩුවක් මෙම නඩුවේදී ඉදිරිපත් කර ඇත. මේ අනුව අධිකරණය විසින් විත්තිවාචිකය කැඳවීමක් කර ඇත. විත්තිය විසින් නගන ලද හරස් ප්‍රශ්ණ වලදී හා විත්තියේ සාක්ෂි මගින් ගන්නා ලද ස්ථාවරය වී ඇත්තේ, මෙම රුපියල් 25,000 ක මුදල් විත්තිකරු විසින් තම රියදුරුට ලබා දීමෙන් පසුව පැමිණිලිකරු විසින් එය බැංකුවේ තැන්පත් කර ඇති බවයි. මෙවැනි අපරාධ නඩුවකදී විත්තියේ සාක්ෂිද අධිකරණය පැමිණිල්ලේ සාක්ෂි මෙන් ඇගයීමට ලක් කලයුතුවේ. මේ සම්බන්දයෙන් අධිකරණය කරුණාදාස එරෙහිව ඕ.අයි.සී මෝටර් රථවාහන නිර්ටමුව 1978 1 එස්.එල්.ආර් 155 නඩුව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී. මෙම නඩු තීන්දුවේදී ප්‍රකාශ වී ඇත්තේ, පැමිණිල්ලේ සාක්ෂි මෙන්ම විත්තියේ සාක්ෂිද විශ්ලේෂණය කිරීමෙන් පසුව අධිකරණය තම තීරණයට එළඹිය යුතු බවයි. කෙසේ වුවද විත්තියේ සාක්ෂි විශ්ලේෂණය කලයුතු වන්නේ පැමිණිල්ල විසින් බලගතු නඩුවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදීය. පැමිණිල්ලේ සාක්ෂි මගින් විත්තිකරුට එරෙහිව බලගතු නඩුවක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී විත්තියේ සාක්ෂි විශ්ලේෂණය නොකරම විත්තිකරු නිදොස් කර නිදහස් කිරීමේ බලයක් අධිකරණයට ඇත. එහෙත් පැමිණිල්ල බලගතු නඩුවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී එම පැමිණිල්ලේ සාක්ෂි

26 APR 2010

සම්බන්ධයෙන් විත්තියට සාධාරණ සැකයක් ඇති කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී විත්තියේ සාක්ෂි මගින් පැමිණිල්ලේ නඩුව සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇති වන්නේ නම් එහි වාසිය විත්තියට ලබා දියයුතුය. මේ සම්බන්දයෙන් අධිකරණය ජයතුංග එරෙහිව නීති පති **2001 1 එස්. එල්. ආර** නඩු තීන්දුව සම්බන්ධයෙනුත් පහත සඳහන් නඩු තීන්දුව සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන ලදී.

<u>රැජින එරෙහිව බුද්ධරක්ඛිත තෙර</u> <u>63 එන්.එල්.ආර් 43</u>

<u>රැජින එරෙහිව රාසා 70 එන්.එල්.ආර් 403</u>

<u>මුස් එරෙහිව රැජින 75 එන්.එල්.ආර් 121</u>

<u>රැජින එරෙහිව කුලතුංග</u> 71 එන්.එල්.ආර් 529

26 APR 2010

මෙම නඩු තීන්දු කෙරහිද අධිකරණය අවධානය යොමු කරමින් අධිකරණය පැමිණිල්ල විසින් බලගතු නඩුවක් ඉදිරිපත් කර ඇති බැවින් විත්තියේ සාක්ෂි අනුව පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇති වේද යන්න අධිකරණය පරීක්ෂාවට ලක් කරන ලදී. විත්තිකරු අධිකරණයේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් පැ. 7 ලේඛණය පැමිණිලිකරුට ලබා නොදුන් බවත්ය. එම ලේඛණය තමන් තමන්ගේ රියදුරු වන මාපාට ලබාදුන් බවත් එම ලේඛණය ලබාදීමෙන් පසුව මුදල් වගයක් බැංකුවේ තැන්පත් කිරීමට රියදුරුට කියා සිටි බවත්ය. ඒ අනුව රුපියල් 25,000 ක මුදලක් විත්තිකරුගේ ගිණුමට තැන්පත් කිරීමට තමන්ගේ රියදුරුට දුන් බවත් විත්තිකරු ප්‍රකාශ කර ඇත. තමන් කිසිදු අවස්ථාවකදී වීරසිංහ නැමැති පැමිණිලිකරුට රුපියල් 25,000 ක් තැන්පත් කිරීමට නොදුන්

බවත් ඔහු ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද විත්තිකරු තමන්ගේ මහජන බැංකුවේ ගිණුම් අංක 525 ගිණුමට රුපියල් 25,000 ක් ගිණුම් ගත වී තිබුන බව පිලිගෙන ඇත. එම මුදල තමන් මාපා නැමැති රියදුරුට දුන් මුදල් බවත් ප්‍රකාශ කර ඇත. මාපා නැමැත්තා ප්‍රදේශිය සභාවේ රියදුරු බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව විත්තිකරු ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් දෙන ලද සාක්ෂිය අසත්‍ය සාක්ඕයක් බවයි. මේ හැරුනු විට පැ. 10 කුවිතාන්සිය අනුව තැන්පත් කර තිබෙන මනෝද විජේරත්නට අයිති චෙක් පත්‍රය තමන් කිසිදු අවස්ථාවකදී පැමිණිලිකරුට නොදුන් බවද ප්‍රකාශ කර ඇත. තමන්ට මනෝද විජේරත්න කිසි දිනෙක චෙක්පත්‍රයක් දීලා තිබුන් නැති බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව පැමිණිලිකරු තැන්පත් කර තිබෙන පැ. 10 චෙක් පත්‍රය විත්තිකරු විසින් දුන් බව විත්තිකරු පිලිගෙන නැත. මේ හැරුනු විට විත්තිකරු ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු වන විරසිංහ හා ප්‍රදේශීය සභාව අතර විවිධ ගැටුම් මතු වී තිබුන බවත් තමන් ඒ සම්බන්දයෙන් පැමිණිලිකරුට දෝශාරෝපනය කර ඇති බවත් ලිඛිතව එසේ කර නොමැති බවත්ය. මෙම විත්තිකරු සාක්ෂි දෙමින් තමන් හා පැමිණිලිකරු අතර ප්‍රාදේශිය සභාවේදී විවිධ ගැටළු මතු වී තිබූ බව ප්‍රකාශ කර ඇති වුවද විත්තිකරු හා පැමිණිලිකරු අතර දැඩි අමනාපයක් තිබූ බව විත්තිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර නැත. තවද පැමිණිලිකරු මෙසේ අසත්‍ය සාක්ෂි දීමට හේතුව ප්‍රාදේශිය සභාවේ උප සභාපති තුමා තමා සමග තිබෙන විරුද්ධත්වය මතබව විත්තිකරු සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. උප සභාපතිවරයා පැමිණිලිකරුගේ මිත්‍රයකු බවත්ය. එසේ වුවද එම කරුණ සනාථ කිරීමට මෙම නඩුවේදී විත්තිය සමත් වී නැත. උප සභාපතිවරයාගේ තමන් සමග ඇති

26 APR 2010

විරුද්ධත්වය මත මෙම පැමිණිලිකරු අසත්‍ය සාක්ෂි දෙන බව තහවුරු කිරීමට විත්තිකරු සමත්වී නැත. විත්තිකරුගේ එම සාක්ෂිය මත පැමිණිලිකරු ගේ සාක්ෂිය සම්බන්ධයෙන් අතර සාධරණ සැකයක් ඇති කිරීමටද විත්තිය සමත් වී නැත. එබැවින් එම ප්‍රාදේශීය සභාවේ උප සභාපති සමග ඇති මිත්‍රත්වය මත පමිණිලිකරු අසත්‍ය සාක්ෂි දෙන බවට විත්තිකරු දෙන ලද සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් යුත් බවට අධිකරණයට පිලිගත නොහැකිය. තවද මෙම නඩුවේදී විත්තිකරු වෙනුවෙන් සාක්ෂියට කැදවන ලද මාපා නැමැති රියදුරු අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, තමන්ට මෙම රුපියල් 25,000 ක මුදල බැංකුවේ තැන්පත් කිරීමට පැ.7 ලේඛණය සමග විත්තිකකරු විසින් ලබාදුන් බවත්ය. මෙම සිද්ධිය වූ අවස්ථාවේදී තමන් කැබ් රථයෙන් යන අවස්ථාවේදී පැමිණිලිකරු ද හමු වූ බවත් ඒ අනුව පැමිණිලිකරු තමන්ගේ කැබ් රථයෙන් කැගල්ලට යන ලද බවත්ය. එම අවස්ථාවේදී තමන්ට විත්තිකරු විසින් ලබා දුන් රු 25,000 ක මුදල වීරසිංහ නැමැති පැමිණිලිකරුට කැගල්ල බැංකුවේ තැන්පත් කිරීමට දුන් බවත්ය. තමන් එය කැගල්ල මහජන බැංකුව් තැන්පත් කිරීමට පැමිණිලිකරුට දුන් බවත්ය . මෙම මාපා නැමැති රියදුරු ප්‍රකාශ කර ඇත්තේ, පැ.7 ලේඛණයද රුපියල් 25,000 ද තමන් විත්තිකරු දුන් බවත් එම මුදල් හා තුංඩුව තමන් බැංකුවේ මුදල් තැන්පත් කිරීමට පැමිණිලිකරුට දුන් බවත්ය. කෙසේ වුවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, පසුව ප්‍රාදේශීය සභාවේදී පැමිණිලිකරු හමු වූ බවත් එවිට රුපියල් 20,000 තැන්පත් කල බව කියා සිටි බවත් රිසිට් පත්‍රය පෙන්වූ බවත්ය. එසේම පැමිණිලිකරු තමන්ට හදිසි මුදල් අවශ්‍යතාවයක් තිබෙන බව ප්‍රකාශ කරමින් රුපියල් 20,000 ක් තැන්පත් කල බව කිව්ව බවත් එම

26 APR 2010

අවස්ථාවේදී රුපියල් 25,000 ක් තැන්පත් කරන්න දුන් විට රුපියල් 20,000 ක් තැන්පත් කල නිසා තමන් හා පැමිණිලිකරු අතර බහින්බස්වීමක් සිදු වූ බවත්ය. එම රියදුරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, එම රුපියල් 5000 අනිවාර්‍යයෙන්ම පසුවදා දාන බව පැමිණිලිකරු ප්‍රකාශ කල බවයි. පසුව එම රුපියල් 5000 තැන්පත් කර රිසිට් පත්‍රය පැමිණිලිකරු විසින් ලබා දුන් බවත් ප්‍රකාශ කර ඇත. මේ අනුව විත්තිකරුගේ රියදුරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැ. 7 හා මුදල් විත්තිකාර සභාපතිවරයා විසින් බැංකුවේ තැන්පත් කිරීමට දෙන ලද මුදල් බවත් එම මුදල් තමන් විරසිංහට බැංකුවේ තැන්පත් කිරරීමට දුන් බවත්ය. කෙසේ වුවද විත්තිකරුග් සාක්ෂියේදී විත්තිකරු දෙදිනකදී මෙම මුදල් බැංකුවේ තැන්පත් කිරීම පිළිබඳව රියදුරු තමන්ට කිසිදු හේතුවක් දැක්වූ බව අධිකරණයට ප්‍රකාශ කර නැත. තවද විත්තිකරු තම රියදුරුගෙන් පළමුවන දිනයේදී රුපියල් 20,000 ක මුදලක් සහ ඊලග දිනයේදී රුපියල් 5000 ක මුදලක් තැන්පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්ණ කල බවක්ද තම සාක්ෂියේදී සනාථ කර නැත. මේ අනුව අවස්ථා දෙකකදී මුදල් තැන්පත් කිරීම පිළිබඳව විත්තිකරු රියදුරුගෙන් ප්‍රශ්ණ කර ඇති බවක් අධිකරණයට සනාථ නොවේ. විත්තිකරු මෙම කරුණ සම්බන්ධයෙන් නිහඬතාවයක් තම සාක්ෂියේදී පල කර ඇත. තවද විත්තිකරු අධිකරණයට සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 1995-01-12 වන දින රුපියල් 25,000/-ක මුදලක් තැන්පත් කර ඇති බවයි. මේ සම්බන්දයෙන් අධිකරණය විත්තිකරුගේ සාක්ෂියේ 2008-07-04 වන දින සාක්ෂි පිටුඅංක 10 කෙරහි අවධානය යොමු කරන ලදි.

26 APR 2010

ප්‍ර බැංකු නිලධාරියා කිව්වා 1995-01-12 වන දින තමා බැංකුවට රුපියල් 20,000 ක මුදලක් තැන්පත් කල බව?

උ: ඔව්.

ප්‍ර 1995-11-12 වන දින තමා රුපියල් 25,000ක මුදලක් තැන්පත් කරලා නැහැ?

උ- 11 වෙනිදා නොවෙයි 12 වෙනිදා තැන්පත් කලේ.

ප්‍ර තමා අමූලික බොරුවක් ප්‍රකාශ කරන්නේ?

උ: මම 12 වෙනිදා තැන්පත් කලේ.

ප්‍ර තමා රුපියල් 25,000/-ක් තැන්පත් කරලා නැහැ, රුපියල් 20,000 යි තැන්පත් කරලා තිබෙන්නේ?

උ: එය පිලි ගන්නේ නැහැ.

ප්‍ර තමා එය ප්‍රශ්ණ කරලා නැහැ?

උ: ප්‍රශ්ණ කලා.

26 APR 2010

---------

මේ අනුව මෙම විත්තිකරු අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, රුපියල් 25,000 ක මුදල 12 වන දින බැංකුවේ තැන්පත් කල බවයි. රුපියල් 5000 ක මුදල 13 වන දින තැන්පත් කලබව පිලිගෙන නැත. කෙසේ වුවද රියදුරු 12 වන දා රුපියල් 20,000 ක මුදලක් තැන්පත් කල බවද 13 වන දින රුපියල් 5000 ක මුදලක් තැන්පත් කල බවද

ප්‍රකාශ කර ඇත. ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරුගෙන් ප්‍රශ්ණ කරන ලද බවත් ප්‍රකාශ කර ඇත. මීට පරස්පරව විත්තිකරු 1995-01-12 වන දින රුපියල් 25,000 ක් තැන්පත් කල බවට ප්‍රකාශ කිරීමෙන් රියදුරුගේ හා විත්තිකරුගේ සාක්ෂියේ පරස්පරතාවයක් ඇත. මේ අනුව විත්තිකරුගේ සාක්ෂිය හා රියදුරුගේ සාක්ෂිය විශ්වාසනියත්වයෙන් තොර බව අධිකරණයට සනාථ වි ඇත. මේ හැරුනු විට රුපියල් 25000 ක මුදලක් තමා රියදුරුට බැංකුවේ තැන්පත් කිරීමට ලබා දීමෙන් පසු එම දිනයේදී එම රුපියල් 25000 තැන්පත් නොකිරීම පිළිබදව විත්තිකරු තම රියදුරුගෙන් ප්‍රශ්ණ කරනු ලැබ ඇති බවට හා ඒ පිළිබදව තම රියදුරු දෙන ලද පිළිතුර පිළිබදව විත්තිකරු තම සාක්ෂියේදී ප්‍රකාශ කර නැත. මෙබැවින් විත්තිකරුගේ රියදුරු විසින් දෙන ලද සාක්ෂිය අධිකරණයට සත්‍ය සාක්ෂියක් බවට පිලිගත නොහැකිය. තවද මෙම නඩුවේදී විත්තිකරු හා පැමිණිලිකරු අතර අමනාපයක් මත පැමිණිලිකරු අසත්‍ය සාක්ෂි දෙන බව ප්‍රකාශ කර ඇති වුවද මෙම නඩුවේ සිද්ධිමය කරුණු අනුව තුටුපඩුරු ඉල්ලා සිටිම සම්බන්ධයෙන් පැමිණිලිකරු අල්ලස් කොමිෂමට පැමිණිලි කර ඇති බවක් සනාථ නොවේ. පැමිණිලිකරු හා විත්තිකරු අතර අමනාපයක් තිබුනේනම් මෙම අල්ලස් මුදල ඉල්ලා සිටිම හා භාර ගැනිම සම්බන්ධයෙන් පැමිණිලිකරුට අල්ලස් කොමිෂමට පැමිණිලි කිරීමට හැකියාවක් තිබි ඇත. එහෙත් එසේ පැමිණිලි කර ඇති බවක් සනාථ නොවේ. වෙනත් පරික්ෂණයකදී හෙලි වූ කරුණු මත මෙම චෝදනා ඉදිරිපත් කර ඇති බවක්ද අධිකරණයට සනාථ වේ.

26 APR 2010

මෙබැවින් පැමිණිලිකරු හා විත්තිකරු අතර දැඩි අමනාපයක් මත මෙම පැමිණිලිකරු විත්තිකරුට එරෙහිව සාක්ෂි දෙන බවට විත්තිකරු දී ඇති සාක්ෂිය අධිකරණයට සත්‍ය සාක්ෂියක් ලෙසට පිලිගත නොහැකිය. මෙම නඩුවේදී විත්තිකරු වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු වන මනෝද විජේරත්න නැමැති රජයේ ඇමතිවරයා අධිකරණයේ සාක්ෂි දී ඇත. ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ප්‍රාදේශිය සභාපති සහ උප සභාපති අතර ප්‍රශ්ණයක් ඇති වෙන්න පුළුවන් බවත් සභාපතිට විරුද්ධව කිසිදු චෝදනාවක් තිබුනේ නැති බවත්ය. තවද මෙම විත්තිකරු වරකාපොල ප්‍රාදේශිය සභාවේ සභාපති බවයි. . ඔහුව අවුරුදු 25 ක පමණ කාලයක් දන්නා බවත් ඔහුගේ පියා දේශපාලන කටයුතු කරන ලද බවත් මනෝද විජේරත්න ඇමතිවරයා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. තවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, තමන්ගේ ගිණුමෙන් විත්තිකරුට චෙක් පතක් ලබා දී නොමැති බවයි. තමන් සමහර අවස්ථා වලදී මුදල් චෙක්පත් මාර්ගයෙන් දෙන බවත් සාක්ෂිකරු ප්‍රකාශ කකර ඇත. තමන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් දන්නේ පොලිසියෙන් ඇවිත් සාක්ෂි දෙන්න කැඳවන අවස්ථාවේදී බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. තවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, කරුණාසේකර_නැමැති ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රිවරයාට ඔහුගෙන් ලබා ගත් සේවය සදහා මෙම චෙක්පත් ලබා දී ඇති බවත් කරුණාසේකරට බැංකු ගිණුමක් නැති නිසා ප්‍රදේශිය සභාවේදී පැමිණිලිකරුට මෙම චෙක්පත්‍රය දීලා තිබෙන බවත්ය. මෙම සාක්ෂිකරු මෙසේ වෙනත් පුද්ගලයකුට මෙම චෙක් පත්‍රය ලබා දී ඇති

26 APR 2010

බවට සාක්ෂි දී ඇති වුවද එම සාක්ෂිය තහවුරු කිරීමට ' වින්තිය කටයුතු කර නොමැත. කරුණාසේකර මන්ත්‍රීවරයා මෙම සාක්ෂිකරුට ප්‍රකාශ කරන ලද දෙයක් පිළිබඳව ප්‍රවාධක සාක්ෂි දෙමින් පැමිණිලිකරුට ඔහු විසින් චෙක් පත්‍රය භාර දීමට දී ඇති බව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති වුවද එය තහවුරු කිරීමක් කර නොමැති බැවින් එය විශ්වාසනීයත්වයෙන් යුත් බවට පිලිගත නොහැකිය. තවද සාක්ෂිකරු මෙම චෙක් පත්‍රය තැන්පත් කිරීමේ කුවිතාන්සිය අනුව තමන් දුන් චෙක් පත්‍රය ද කියා නිශ්චිතවම හඳුනා ගැනීමට නොහැකි බව ප්‍රකාශ කර ඇත. චෙක් පත්‍රයේ පිටපතක් නොමැති බවත් ප්‍රකාශ කර ඇත. මෙම විත්තිය වෙනුවෙන් කැඳවන ලද ඇමතිවරයා විත්තිකරුගේ පක්ෂයේ අයකු බව ප්‍රකාශ කර ඇත. ඔහු එක්සත් ජාතික පක්ෂ දේශපාලන කාලයේ සිට විත්තිකරු හඳුනන බවත් ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරු විත්තිය වෙනුවෙන් නගන ලද හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු ප්‍රකාශ කර ඇත්තේ, තමන්ගේ දැනුම අනුව මෙම චෙක් පත්‍රය ලබා දී ඇත්තේ, කරුණසේකර මන්ත්‍රීවරයාට බවයි. එහෙත් 2700/- ක චෙක් පත්‍රය කරුණාසේකර නියමිතව ලබා දුන් බවට තහවුරු කිරීමක් කර නොමැත. කෙසේ වුවද මෙම රුපියල් 2700/- ක චෙක් පත්‍රය විත්තිකරු විසින් පැමිණිලිකරුට ලබා දීම පිළිබඳ සාක්ෂිය පැමිණිලිකරුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය සම්බන්දයෙන් සළකා බැලීමට වැදගත් වන කරුණක් වන නමුත් එම තුටු පඩුර භාරගැනීම හා අයදීම පිළිබඳව පැමිණිලිකරු දෙන ලද සාක්ෂිය බිඳ හෙලීමට ආධාර වන සාක්ෂියක් නොවන බව අධිකරණයට

5 APR 2010

සනාථ වේ. මෙම රුපියල් 2700/- චෙක්පත්‍රය තුටු පඩුරු ඉල්ලීම හා භාර ගැනීම කල පසු විත්තිකරු විසින් පැමිණිලිකරුට ලබා දුන් චෙක්පත්‍රයක් වේ. එබැවින් තුටු පඩුරු ඉල්ලීම හා භාර ගැනීම සම්බන්දයෙන් දෙන ලද සාක්ෂියට, මෙම චෙක්පත්‍රය සම්බන්ධයෙන් විත්තිය විසින් ඉදිරිපත් කරන ලද කරුණු වැදගත් නොවනු ඇත. කෙසේ වුවද 2700/- අනුව පැමිණිලිකරුට ලබා නොදුන් බවට මනෝද විජේරත්නගේ සාක්ෂිය මත පැමිණිලිකරුගේ සාක්ෂියේ විශ්වාසනියත්වට හානි සිදු වී නැත. එම ඇමතිවරයා විත්තිකරුගේ යහපත් චරිතය පිළිබඳව සාක්ෂි දී ඇති වුවද එම කරුණ මත පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් අධිකරණයට සනාථ වී නැත. මේ අනුව අධිකරණය මෙම නඩුවේ විත්තිය විසින් කැඳවන ලද විත්තිකරු ඇතුළු සියළු සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ඇගයීමෙන් පසු අධිකරණය නිගමනය කරනුයේ එම විත්තියේ සාක්ෂි මගින් පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධරණ සැකයක් ඇති කිරීමට විත්තිය සමත් වී නැති බවයි. පැමිණිල්ල තම සාක්ෂි මගින් බලගතු නඩුවක් අධිකරණයට ඉදිරිපත් කර ඇත.

26 APR 2010

මීලගට අධිකරණය සළකා බලනුයේ පැමිණිල්ල විසින් මෙවැනි අපරාධ නඩුවකදී අධිචෝදනාවන්හි ඔප්පු කලයුතු ප්‍රධාන අංග මෙම නඩුවේදී සනාථ කර ඇද්ද යන්නයි. පමිණිලිකරු හා පැමිණිල්ලේ සාක්ෂි මෙම අධිකරණය මීට ඉහත දී සදහන් කරන ලද හේතුන් මත විශ්වාසනීයත්වයෙන් යුත් බවට පිලිගෙන ඇත. පැමිණිලිකරු 1995-1-

1 සහ 13 වන දින අතර කාලයේදී විත්තිකරු රුපියල් 25,000 ක තුටු පඬුරක් පැමිණිලිකරුගෙන් අයැදී සිටි බව 1 වන අධිචෝදනාව අනුව සනාථ කර ඇත. මේ සම්බන්ධයෙන් පැමිණිලිකරු දෙන ලද සාක්ෂියේදී පැමිණිලිකරු අධිකරණයට ප්‍රකාශ කර ඇත්තේ, 1995 ජනවාරි මාසයේ මුල් දින වලදී ප්‍රාදේශීය සභාවේදී විත්තිකරු රුපියල් 25,000 ක් තමන්ගෙන් ඉල්ලා සිටි බවයි . එසේ ඉල්ලා ලද්දේ උඩගම, තඹදිය ඔිවිටිගල පාරවල් තුනෙහි වැඩ නිම නොකර මුදල් ගෙවලා තියෙනවා කියලා ඒ අනුව රුපියල් 25,000 ක් ඉල්ලා සිටි බවටයි. අධිචෝදනාවේ සදහන් අන්දමට 1995 ජනවාරි මාසයේ මුල් දින අතර කාලපරිච්ජේදය තුල මෙම මුදල් ඉල්ලීම කර ඇති බව අධිකරණයට පැමිණිල් සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇත. මෙම අල්ලස් ඉල්ලීම සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ සාක්ෂිය විත්තිය විසින බිද හෙලා නැති අතර, ඒ අනුව පැමිණිලිකරු ගේ සාක්ෂිය විශ්වාසනියත්වයෙන් යුත් බවට අධිකරණය සලකන ලදි. විත්තිකරුගේ අනන්‍යතාවයද පැමිණිල්ලේ සාක්ෂි මගින් සනාථ කර ඇත. තවද විත්තිකරු රජයේ සේවකයකු බව දෙපක්ෂයේ පිලි ගැනීම මත අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වන වගන්තිය අනුව සටහන් කර ඇත. මේ අනුව විත්තිකරු රජයේ සේවකයකු බව පැමිණිල්ල සනාථ කර ඇත. තවද මෙම නඩුවේදී විත්තිකරුට මෙම තුටු පඬුර ඉල්ලා සිටිම හා භාර ගැනිම සදහා නිත්‍යානුකූල අයිතියක් ඇති බව අල්ලස් සංශෝධන පනතේ 19(ඇ) වගන්තිය යටතේ විත්තිය සනාථ කර නැත. එබැවින් 2 වන අධිචෝදනාව යටතේ මෙම තුටු පඬුරු ඉල්ලීම

26 APR 2010

සම්බන්ධයෙන්ද විත්තිකරු වගකිවයුතු බව පැමිණිල්ල සාධරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇත. තවද අල්ලස් සංශෝධන පනතේ 21(ඇ) වගන්තිය යටතේ 1 වන අධිචෝදනාව පැමිණිලිකරුට කොන්ත්‍රාත්තුව මත දී ඇති වැඩ අවසන් නොකරන ලද පාරක් සඳහා වව්චර් පත් මගින් මුදල් ලබාදීම සම්බන්ධයෙන් මෙම තුටු පඩුර අයැද ඇති බව පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇත. පැමිණිල්ලේ සාක්ෂිකරුවන් මගින්ද පැමිණිල්ලේ ලේඛණ මගින්ද මේ අනුව අල්ලස් සංශෝධන පනතේ 21(ඇ) වගන්තිය යටතේ මෙම කොන්ත්‍රාත්තුව ලබා දීම මත සහ එය නිම කිරීමට ප්‍රථම එම ප්‍රාදේශිය සභාවෙන් මුදල් ගෙවීමට සහ ඉදිරි කොන්ත්‍රාත් සඳහා සහන ලබා දීමටද මෙම තුටු පඩුර අයදි ඇති බව අධිකණයට සනාථ වේ. තවද 3 වන අධිචෝදනාවේ සඳහන් පරිදි අල්ලස් සංශෝධන පනතේ 21(ඇ) වගන්තිය යටතේ රුපියල් 20,000 ක මුදලක් භාරගෙන ඇති බවත් 4 වන අධිචෝදනාව යටතේ රුපියල් 5000 ක් භාර ගෙන ඇති බවත් අධිකරණයට පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇත. තවද අල්ලස් පනතේ 19(ඇ) වගන්තියේ 5,6 අධිචෝදනාවන්හි සඳහන් පරිදි රුපියල් 20,000 ක මුදලක් තුටු පඩුරක් වශයෙන් භාර ගත් බවත් රුපියල් 5000 ක මුදලක් අධිචෝදනාවේ සඳහන් පරිදි භාර ගත් බවත් පැමිණිල්ල මෙම නඩුවේදී සාක්ෂි මගින් සාධාරණ සැකයෙන් තොරව සනාථ කර ඇත. මෙම මුදල් ලබාගෙන ඇත්තේ, අල්ලස් සංශෝධන පනතේ 21(ඇ) වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව මත පාරක් සකස් කිරීම සඳහා යම් සහනයන් පැමිණිලිකරුට ලබා දීම

26 APR 2010

සම්බන්ධයෙන් බවත් අධිකරණයට වැඩිදුරටත් සනාථ වේ. මේ අනුව 1,2,3,4,5,6 අධිචෝදනාවන්හි සදහන් පරිදි තුටු පඩුරක් භාර ගැනීම හා අයැද සිටීම පැමිණිල්ල විසින් මෙම නඩුවේදී සාධාරණ සැකයෙන් තොරව සාක්ෂි මගින් සනාථ කර ඇති බව අධිකරණයට සනාථ වේ.

26 APR 2010

තවද මෙවැනි නඩුවකදී පැමිණලිකරුගේ සාක්ෂිය මත පමණක් වුවද විත්තිකරු වරදකරු කිරීමට අධිකරණයට නීතිමය බලයක් ඇත. මෙම නඩුවේ පැමිණිලිකරුගේ සාක්ෂිය විශ්වාසනියත්වයෙන් යුත් සාක්ෂියක් ලෙස අධිකරණය සළකා ඇත. කෙසේ වුවද අනෙකුත් සාක්ෂි මගින්ද පැමිණිලිකරුගේ සාක්ෂිය තහවුරු වි ඇත. පැමිණිලිකරුගේ සාක්ෂිය මතම පමණක් විත්තිකරු වරදකරු කිරීමට අධිකරණයට බලයක් මෙම නඩුවේ සාක්ෂි අනුව ඇති බවක්ද අධිකණය තවදුරටත් නිගමනය කරමි. මේ පිලිබදව අධිකරණය අල්ලස් පනතේ 79(1) වගන්තිය කෙරහිත් සාක්ෂි ආඥා පනතේ 134 වගන්තිය කෙරෙහිත් සුනිල් එරෙහිව නිතිපති නඩුව සම්බන්ධයෙනුත් අධිකරණයේ අවධානය යොමු කරනලදී. අල්ලස් පනත, සාක්ෂි ආඥා පනත, සහ පිලිගත් නඩු තින්දු අනුවද තිරණය වි ඇත්තේ. පැමිණිලිකැගේ සාක්ෂි තහවුරු කිරීමකින් තොරව වුවද එම සාකෂිය විශ්වාසනියත්වයෙනු යුත් නම් එම සාක්ෂිය මත විත්තිකරු වරදකරු කිරීමට හැකි බවයි. එහෙත් එවැනි අවස්ථාවකදී පැමිණිලිකරුගේ සාක්ෂිය ඉතාමත් සුපරික්ෂාකරීව අධිකරණය විසින් ඇගයිය යුතු වේ. ලියනගේ එරෙහිව නිති පති 1978/1979 2 එස්.එල්.ආර් 11 නඩු තින්දුව

කෙරෙහි අවධානය යොමු කරන ලදී. අල්ලස් ඉල්ලීම හා භාර ගැනීම සම්බන්ධයෙන් නඩුවකදී තහවුරු වීමේ සාක්ෂි වලින් තොරව පැමිණිලිකරුගේ සාක්ෂිය මත පමණක් සැකකරුවකු විත්තිකරුවකු කිරීම අනාරක්ෂිත ක්‍රියාවක් බවත් එහි සඳහන් වී ඇත. එසේ වුවද අල්ලස් පනතේ 79(1) වගන්තිය අනුව පැමිණිලිකරුගේ සාක්ෂිය මතම පමණක් ඔහු ඉතාමත් විශ්වාසවන්ත සාක්ෂියක් දී ඇත්නම් විත්තිකරුවකු වරදකරුවකු කිරීමට අධිකරණයට නීතිමය අයිතියක් ඇත. මේ සම්බන්දයෙන් අධිකරණය <u>ගුණසේකර එරෙහිව නීතිපති 79 1 එස්.එල්.ආර් 378</u> නඩුවේ වෛත්‍යලිංගම් විනිසුරුවරයා විසින් කර ඇති ප්‍රකාශය කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී. එම නඩුවේදී ප්‍රකාශ වී ඇත්තේ, පැමිණිලිකරුගේ සාක්ෂිය ඉතාමත් සුපරික්ෂාකාරී වියයුතු බවයි. මේ අනුව පිලිගත් නඩු තීන්දු අනුව පැමිණලිකරුගේ සාක්ෂියේදී නඩුවේ අරටුවට බලපාන පරස්පරතාවයක් හෝ ඌනතාවයන් නැත්නම් සහ විත්තියේ සාක්ෂි මගින් පැමිණිලිකරුගේ නඩුව සම්බන්ධයෙන් සැකයක් ඇති කර නැත්නම් පැමිණිලිකරුගේ සාක්ෂිය මත පමණක් වුවද විත්තිකරු වරදකරු කිරීමට නිතිමය බලයක් ඇත. මෙම නඩුවේදී අධිකරණය පැමිණිලිකරුගේ සාක්ෂිය ඉතාමත් සුපරීක්ෂාකාරීව ඇගයීමට ලක් කරන ලදී. එම ඇගයීමේදී අධිකරණය තීරණය කරනුයේ විත්තිකරු විසින් ගන්නා ලද ස්ථාවරය මගින් පැමිණිලිකරුගේ සාක්ෂියට හානි සිදුවී නැති බවයි. මෙම නඩුවේදී විත්තිකරු විසින් මෙම පැමිණිලිකරු විසින් මහජන බැංකුවේ මුදල් තැන්පත් කිරීම පිළිබඳව හබ කර

26 APR 2010

නැත. විත්තිකරු හබ කර ඇත්තේ, මෙම මුදල් තැන්පත් කිරීම විත්තිකරුගේ ඉල්ලීම මත පැමිණිලිකරු විසින් කර නැති බවයි. විත්තිකරු විසින් තම රියදුරුට තැන්පත් කිරීමට දෙන ලද මුදල් මෙම පැමිණිලිකරු විසින් තැන්පත් කර අසත්‍ය චෝදනා විත්තිකරුට විරුද්ධව ඉදිරිපත් කර ඇති බවයි. එහෙත් එම ස්ථාවරය මෙම නඩුවේදී සනාථ කිරීමට විත්තිය සමත් වී නැත. මෙබැවින් අධිකරණය අවසාන වශයෙන් තීරණය කරනුයේ පැමිණිලිකරුගේ සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් යුත් සාක්ෂියක් බවයි. කෙසේ වුවද පැමිණිලිකරු මුදල් බැංකුවේ තැන්පත් කිරීම හා කොන්ත්‍රාත්තුව ප්‍රාදේශීය සභාවෙන් පැමිණිලිකරුට ලබා දීම අනෙකුත් සාක්ෂ මගින් සනාථ වී ඇත මේ හැරුනු විට කාර්මික නිලධාරී ගුණරත්න ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරු විසින් ටෙන්ඩර්පත්‍රය මත ලබා ගත් පාර සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීමට පෙර මෙම විත්තිකරු ගේ උපදෙස් මත මුදල් ගෙවීමට වවුචර් සකස් කල බවයි. ඒ සඳහා එම ගෙවීම් කර ඇති බවයි. මෙම සාක්ෂිය බිඳ හෙළීමට විත්තිය සමත් වී නැත. මේ අනුව අධිකරණයට සනාථ වන්නේ මෙම විත්තිකරු තුටු පඩුරක් ඉල්ලීම හා භාර ගැනීම ටෙන්ඩර් පත්‍රය මත කොන්ත්‍රාත්තුව සඳහා ලබාගත් පාර අළුත්වැඩියාව නිම කිරීමට පෙර මුදල් ගෙවීම හා වෙනත් සහන ලබා දීම සඳහා ලබාගෙන ඇති බවයි. මෙම නඩුවේදී විත්තිය විසින් විත්තිකරුගේ යහපත් චරිතය සාක්ෂි මගින් සනාථ වී ඇති බැවින් එම සාක්ෂිය සම්බන්දයෙන් අධිකරණයේ අවධානය යොමු කරන ලෙසත්, තම දේශණ වලින් ඉල්ලා ඇත. මෙම නඩුවේදී විත්තිය විසින්

26 APR 2010

ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් මනෝද විජේරත්න ඇමතිවරයා විත්තිකරු හපත් චරිතයක් ඇති බව ප්‍රකාශර ඇති වුවද ඔහුගේ සාක්ෂිය ඔහු හා විත්තිකරු අතර ඇති දැඩි සම්බන්ධතාවය මත ස්වාධින සාක්ෂියක් ලෙස අධිකරණයට සැලකිය නොහැකිය. විත්තිකරු හා මෙම ඇමතිවරයා එකම පක්ෂයක සාමාජිකයන් වි සිට ඇති අතර, ඒ අනුව ඔවුන් අතර දැඩි සම්බන්ධතාවක් ඇති බව සාක්ෂි අනුව සනාථ වි ඇත. ඒ අනුව විත්තිකරුගේ චරිතය පිළිබඳව එම සාක්ෂිකරුගේ සාක්ෂිය විශ්වාසනියත්වයෙන් යුත් සාක්ෂියක් ලෙස අධකරණයට පිලිගත නොහැකිය. විත්තිකරුට පෙර වැරදි නොතිබුන පමණින් ඒ මත හා විත්තකරුගේ පෙර යහපත් චරිතය මත පැමිනිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ඇති කර ගැනිමට අධිකරණයට නොහැකිය. පැමිණිල්ල බලගතු නඩුවක් ඉදිපත් කර ඇති අවස්ථාවේදී පැමිනිල්ලේ සාක්ෂි කෙරෙහි සාධරණ සැකයක් විත්තිය විසින් ඇති කලයුතු වේ. විත්තිකරුගේ යහපත් චරිතය හා පෙර වැරදි නොමැති බව විත්තිකරුට දඬුවම් නියම කිරීමේදී සළකාබැලීමට අධිකණයට හැකියාවක් ඇත. මෙම නඩුවේදී විත්තිකරුගේ යහපත් චරිතය පිළිබඳව මනෝද විජේරත්න ඇමතිවරයාගේ සාක්ෂිය ස්වාධින සාක්ෂියක් ලෙස අධිකරණයට පිලිගත නොහැකිය. කෙසේ වුවද එම හොද චරිතය මත මෙවැනි වරදක් විත්තිකරු නොකර සිටිමේ ප්‍රවනතාවය ධිකරණයට මෙම නඩුවේ තිරණය කල හැකිය. පැමිනිල්ල බලගතු නඩුවක් විත්තිකරුට එරෙහිව ඉදිරිපත් කර ඇත. මෙබැවින් අධිකරණය විත්තිය විසින්

26 APR 2010

විත්තිකරුගේ යහපත් චරිතය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කරමින් ඒ පිළිබඳව නඩු තීන්දු ද ඉදිරිපත් කරමින් අධිකරණයට ඉදිරිපත් කර ඇති කරුණු මෙම නඩුවේදී අදාල නොවන බව තීරණය කරමි. තවද මනෝද විජේරත්නගේ පැ. 10 මත දෙන ලද සාක්ෂිය පැමිණිල්ලේ නඩුවේ හරයට එතරම් බලපා නැත. පැමිණිලිකරුගේ විශ්වාසනියත්වය සම්බන්ධයෙන් පමණක් එය අධිකරණය සළකා බලන ලදි. එසේ සළකා බැලීමෙන් පසු අධිකරණය තීරණය කරනුයේ ඒ මත පැමිණිලිකරුගේ සාක්ෂියේ විශ්වාසනියත්වයට හානි වී නැති බවයි.

26 APR 2010

තවද මෙම නඩුවේදී පැ.සා 1 ගෙන් හරස් ප්‍රශ්ණ අසා තිබුනද මනෝ විජේරත්න නැමැති අය දෙන ලද රුපියල් 2700/- චෙක්පත්‍රය දෙන ලද්දේ පැමිණිලිකරුට නොව වෙනත් පුද්ගලකු වන කරුණාසේකරට බව හරස් ප්‍රශ්ණ වලදී කිසිදු අවස්ථාවකදී අසා නැත. ඒ අනුව විත්තිවාචිකය සම්බන්දයෙන් ඉදිරිපත් කරන ලද මෙම කරුණු සම්බන්ධයෙන් පිළිතුරු දීමට පැමිණිල්ලට අවස්ථාවක් ලබාදී නොමැති බවත් අධිකරණයට සනාථ වේ. ඒ පිළිබඳව සාක්ෂි දීමට කරුණාසේකර මන්ත්‍රිවරයා ද සාක්ෂියට කැඳවා නැත. මේ අනුව එම විත්තිවාචිකය සනාථ කිරීමක්ද විත්තිය විසින් කර නැත.

ඉහත සදහන් ආකාරයට පැමිණිල්ල හා විත්තියේ සාක්ෂි ඇගයීමෙන් හා මෙවැනි අපරාධ නඩුවක් පැමිණිල්ල විසින් ඔප්පුකලයුතු

නිතිමය තත්ත්වය පිළිබඳවද කරුණු සළකා බලා අධිකරණය තීරණය කරනුයේ පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව විත්තිකරුට එරෙහිව ඉදිරිපත් කර ඇති සියළු අධිචෝදනාවන් සනාථ කර ඇති බවයි. ඒ අනුව විත්තිකරු ඔහුට විරුද්ධව ඇති 1,2,3,4,5,6 අධිචෝදනාවන්ට වරදකරු බව තිරණය කරමි.

( සුනිල් රාජපක්ෂ )

මහාධිකරණ විනිසුරු - කොළඹ

2010-03-31

ඉහත සඳහන් වනුයේ පිටු අංක 01 - 36 දක්වා කොළඹ මහාධිකරණයේ අංක B. 1486/04 දරණ නඩුවේ [illegible] බවත් [illegible] ගේ ඉල්ලීම මත රාජකාරී කටයුත්තක් සඳහා ගාස්තුවෙන් තොරව නොමිලේ නිකුත් කළ බවත් මෙයින් සහතික කරමි.

දිනය : 2010/04/26

04/26

රෙජිස්ට්‍රාර්
මහාධිකරණය කොළඹ 12

පරීක්ෂා කළා

26 APR 2010